# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2116/31 - 2019 මාර්තු මස 27 වැනි බදාදා - 2019.03.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 24 දරන දේශීය ආදායම් පනත**

93(4) වන වගන්තිය යටතේ නියෝග

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 93 වගන්තියේ 4 වන උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, වැඩබලන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් අසෝක නදුන් ගුරුගේ වන මම, මෙම නියෝගය මගින්, මෙම වගන්තිය යටතේ පනවන ලද 2018 අප්‍රේල් 1 දිනැති සහ අංක 2064/59 දරන *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝගය දැක්වෙන අයිතම අංක 2 පහත දැක්වෙන ලෙස සංශෝධනය කරමි.

ඒ. එන්. ගුරුගේ,
*වැඩබලන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.*

2019 මාර්තු මස 27 වැනි දින,
කොළඹ 02,
දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

1. එම උපලේඛනයේ 2 වන අයිතමය ඉවත් කර පහත අයිතමය ආදේශ කිරීමෙන් :-

"2. (1) යම් ආයෝජන වත්කමක් උපලබ්ධිවීමෙන් වාසික පුද්ගලයකුට ලැබෙන ලැබීමක් රු. 50,000 ඉක්මවන අවස්ථාවේදී අදාළ ආයෝජන වත්කම උපලබ්ධි වීමෙන් මාසයකට නොඅඩු කාලයක් ඇතුළත ප්‍රාග්ධන ලාභ බදු වාර්තාව කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(11) යම් ආයෝජන වත්කමක් උපලබ්ධිවීමෙන් වාසික පුද්ගලයෙකු ලබන ලැබිමක් රු. 50,000 නොඉක්මවන සහ තක්සේරු වර්ෂය තුළ ආයෝජන වත්කම් උපලබ්ධිවීම මගින් වාසික පුද්ගලයෙකු ලබාගන්නා මුලු ලැබීම් රු. 600,000 ඉක්මවන අවස්ථාවේ දී එම රු. 600,000 ඉක්මවීමට පාදක වූ ආසන්නතම ආයෝජන වත්කම උපලබ්ධි වී මාසයකට නොඅඩු කාලයක් ඇතුළත ප්‍රාග්ධන ලාභ බදු වාර්තාව කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය."

04 - 347